# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

අංක 2384/30 - 2024 මැයි මස 17 වැනි සිකුරාදා - 2024.05.17

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**2002 අංක 24 දරන සුබසාධක ප්‍රතිලාභ පනත**

2002 අංක 24 දරන සුබසාධක ප්‍රතිලාභ පනතේ 09 වන වගන්තිය පරිදි, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය රනිල් වික්‍රමසිංහ වන මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මෙහි පහත උපලේඛනවල සඳහන් අස්වැසුම සුබසාධක ප්‍රතිලාභ ගෙවීමේ යෝජනා ක්‍රමය 2024 ජූනි මස 15 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි ප්‍රකාශයට පත් කරමි. 2023 අප්‍රේල් මස 21 වැනි දිනැති අංක 2328/13 දරන සහ 2024 පෙබරවාරි මස 19 වැනි දිනැති අංක 2372/03 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයන්හි* පළකරනු ලැබූ නිවේදන මෙයින් අවලංගු කරමි.

රනිල් වික්‍රමසිංහ,
මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික
ප්‍රතිපත්ති අමාත්‍ය.

2024 ක් වූ මැයි මස 16 වැනි දින.

1A - PG 6732 — 379 (2024/05)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## අස්වැසුම සුබසාධක ප්‍රතිලාභ ගෙවීමේ යෝජනා ක්‍රමය

### I වන උපලේඛනය

#### 1 වගුව

**2024 ජුනි මාසයට පමණක් අදාළ වන විශේෂිත සුබසාධක ප්‍රතිලාභ දීමනාව**

| | සුබසාධක ප්‍රතිලාභ ගෙවීම් ලබන සමාජ කාණ්ඩය | සුබසාධක ප්‍රතිලාභී තැනැත්තන්/පවුල් සංඛ්‍යාව | 2024 ජුනි මාසයට පමණක් අදාළ වන විශේෂිත සුබසාධක ප්‍රතිලාභ දීමනාව (රු.) * |
|---|---|---|---|
| I. | සංක්‍රාන්තික | 400,000 | 30,000 |
| II. | අවධානමට ලක්වූ | 400,000 | 15,000 |
| III. | දුප්පත් | 800,000 | 8,500 |
| IV. | අන්ත දිළිඳු | 400,000 | 15,000 |

* සටහන - පවුලේ සාමාජිකයින් සංඛ්‍යාව 02 හෝ 02 ට අඩු වන අවස්ථාවක ප්‍රතිලාභීන් සඳහා උක්ත දීමනාවෙන් අඩක් පමණක් ගෙවිය යුතුය.

#### 2 වගුව

**2024 ජූලි මස සිට අස්වැසුම සුබසාධක ප්‍රතිලාභ ගෙවීමේ ක්‍රමවේදය**

| | සුබසාධක ප්‍රතිලාභ ගෙවීම් ලබන සමාජ කාණ්ඩය | ගෙවනු ලබන කාල සීමාව | සුබසාධක ප්‍රතිලාභී තැනැත්තන්/පවුල් සංඛ්‍යාව* | පවුල් ඒකකයක් සඳහා වන යෝජිත මාසික සුබසාධක ප්‍රතිලාභ දීමනාව (රු.) ** |
|---|---|---|---|---|
| I. | සංක්‍රාන්තික/ අවධානමට ලක්වූ | 2024.07.01 සිට 2024.12.31 දක්වා | 960,000 | 5,000 |
| II. | දුප්පත් | 2024.07.01 සිට 2026.06.30 දක්වා | 960,000 | 8,500 |
| III. | අන්ත දිළිඳු | 2024.07.01 සිට 2026.06.30 දක්වා | 480,000 | 15,000 |

* සටහන - මෙම සංඛ්‍යාත්මක අගයන් ප්‍රතිලාභී පවුල් ගණනය කිරීම් අනුව සුළු වෙනස්කමකට ලක්විය හැක.

** සටහන - පවුලේ සාමාජිකයින් සංඛ්‍යාව 02 හෝ 02 ට අඩු වන අවස්ථාවක ප්‍රතිලාභීන් සඳහා උක්ත දීමනාවෙන් අඩක් පමණක් ගෙවිය යුතුය.

## II වන උපලේඛනය

### වෙනස් හැකියාවන් සහිත තැනැත්තන්, හඳුනානොගත් වකුගඩු රෝගීන්, වැඩිහිටි ආධාර ලබන තැනැත්තන් සඳහා ගෙවීම

| සුබසාධක ප්‍රතිලාභ ලබන සමාජ කාණ්ඩය | | ප්‍රතිලාභ සඳහා හිමිකම් ලබනු ඇතැයි අපේක්ෂිත තැනැත්තන් සංඛ්‍යාව | මාසික සුබසාධක ප්‍රතිලාභ දීමනාව (රු.) |
|---|---|---|---|
| (i) | ආධාර ලබන වෙනස් හැකියාවන් සහිත තැනැත්තන් | 410,000 | 7,500 |
| (ii) | වකුගඩු ආධාර ලබන තැනැත්තන් | 50,000 | 7,500 |
| (iii) | වැඩිහිටි ආධාර ලබන තැනැත්තන් | 820,000 | 3,000 |

** සටහන - II වන උපලේඛනයෙහි සඳහන් ගෙවීම් 2024.07. 01 දින සිට 2025.06.30 දින දක්වා ගෙවිය යුතුය. සුබසාධක ප්‍රතිලාභ ලේඛනය තුළින් හඳුනාගනු ලැබූ ප්‍රතිලාභීන් සඳහා 2024.07.01 දින සිට අස්වැසුම සුබසාධක ප්‍රතිලාභ ක්‍රමවේදය හරහා ප්‍රතිලාභ ගෙවීම් සිදු කරනු ලැබිය යුතුය.

2023 අප්‍රේල් 21 දිනැතිව අංක 2328/13 දරන *ගැසට් පත්‍රයේ* පළකරන ලද අස්වැසුම සුභසාධක ගෙවීමේ යෝජනා ක්‍රමය මෙයින් අවලංගු කරන අතර, එහෙත් එහි I වන උපලේඛනයට අදාළව මේ වන විටත් ප්‍රතිලාභ සඳහා තෝරාගෙන ඇති හා විවිධ හේතු මත ගෙවීම් සිදු කිරීම ප්‍රමාදව ඇති ප්‍රතිලාභීන් ද, අභියාචනා ඉදිරිපත් කර මේ වන විටත් විභාග කෙරෙමින් පවතින අයදුම්කරුවන් සඳහා ද ඔවුන්ගේ සුදුසුකම් ලැබීම මත එකී ගෙවීම් 2023.12.31 දක්වා ගෙවිය යුතුය.

EOG 05 - 0133

Confidential – for official use only

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදි.